අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/12/01/19/06/01/2024
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.08. 29

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
සියලුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන්,

**<u>සියලුම ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2024</u>**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇති ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/Trans/V/වා.ස්.මා./2024 හා 2023.08.25 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2023 හා බැඳේ.

02. ඒ අනුව ඔබ කාර්යාලය/විද්‍යාපීඨය/විද්‍යාලය/ආයතනය මඟින් පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කරනු ලබන ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්, ඉහත චක්‍රලේඛයේ උපදෙස් පරිදි පහත සඳහන් කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. ස්ථාන මාරු අයදුම් කරන සියලුම නිලධාරීන් මාර්ගගත මෘදුකාංගය (Online Application) තුළට පිවිස වාර්ෂික ස්ථානමාරු අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් (Submit) කර, එහි මෘදු පිටපත **<u>moecombinedservice@gmail.com</u>** යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතු අතර, දෘඩ පිටපත (Hard Copy) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම සඳහා ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව **2023.09.05** දිනට පෙර සාමාන්‍ය ආයතන (ඒකාබද්ධ සේවා) ශාඛාව වෙත යොමු කිරීම අනිවාර්ය වේ.

II. **2023.12.31** දිනට අදාළ සේවා ස්ථානයේ වසර 05ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ තොරතුරුද මාර්ගගත මෘදුකාංගය (Online Application) ඔස්සේ අනිවාර්යයෙන්ම යාවත්කාලීන කර එහි මෘදු පිටපත **<u>moecombinedservice@gmail.com</u>** යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතු අතර, දෘඩ පිටපත (Hard Copy) ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම සඳහා සාමාන්‍ය ආයතන (ඒකාබද්ධ සේවා) ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය.

III. එක් නිලධරයෙකු එක් අයදුම්පතක් පමණක් යොමු කළ යුතුය.

IV. නිලධරයෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධරයාට හෝ ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානියාට හිමිකමක් නොමැති අතර වෛද්‍ය සහතික මඟින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙළෙන ස්ථාන මාරු නොකළ යුතු නිලධරයන් හා ස්ථාන මාරු ලැබීමට ඉඩ ඇතැයි සිතෙන විශේෂ පුහුණු ලබා ඇති නිලධාරියෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම ආයතනය තුළ රඳවා ගත යුතු යැයි ආයතන ප්‍රධානියා අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත් යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පැහැදිලිව සඳහන් කළ යුතුය. (එම කරුණු වසර 05 ට වඩා සේවය කළ නිලධරයන්ගේ ලේඛනයේ වුව ද සඳහන් කළ හැක)

V. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතු වේ. තවද, සාවද්‍ය තොරතුරු අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන නිලධරයන් වගකීමට බැඳී සිටින අතර සාවද්‍යව කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ආර්.බී. ගන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා)
අධ්‍යාපන ලේකම් වෙනුවට

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk